අත්තනගල්ල ප්‍රාදේශීය සභාව
ගම්පහ දිස්ත්‍රික්කය
--------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජූනි 25 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 සැප්තැම්බර් 13 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | -------------- | ----------------------- |
| (අ) | මෝටර් රථ හා කරත්ත රු.13,492,000 ක් සහ ස්ථාවර තැන්පතු ගිණුම රු.107,219 ක් අඩුවෙන් දක්වා තිබුණි. | වත්කම්වල නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතු වේ. | පිළිගනිමි.පැහැදිලි කිරීම් පසුව ඉදිරිපත් කරමි. |
| (ආ) | රු.129,323 ක් වටිනා කර්මාන්ත තැන්පතු 05 ක් සහ රු.2,251,666 ක් වටිනා ඉඩම් ගොඩනැගිලි ශේෂ 06 ක් ගිණුම්වලින් අතහැරී තිබුණි. | ගනුදෙනු ගිණුම්ගත කළ යුතු වේ. | පිළිගනිමි.පැහැදිලි කිරීම් පසුව ඉදිරිපත් කරමි. |
| (ඇ) | පූර්ව වර්ෂයේ ඉදිකිරීම් සිදු නොකරන ලද ව්‍යාපෘති 15 කට අදාලව ප්‍රාග්ධනිත කරන ලද රු.5,253,187 ක මුදලක් ගිණුමෙන් ඉවත්කර නොතිබුණි. | ඉදිකිරීම් සිදු නොකළ ව්‍යාපෘති වල වටිනාකම් ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. පැහැදිලි කිරීම් පසුව ඉදිරිපත් කරමි. |
| (ඈ) | ව්‍යාපෘති 06 කට අදාලව ණයහිමියෝ රු.1,369,143 ක් අඩුවෙන්ද ව්‍යාපෘති 4 කට අදාලව ණයහිමියෝ රු.315,476 ක් වැඩියෙන්ද ගිණුම්ගතකර තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | පිළිගනිමි. පැහැදිලි කිරීම් පසුව ඉදිරිපත් කරමි. |

1.4 **අනුකූල නොවීම**
**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | **නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|---|
| | ---------------------- | ---------------- | -------------- | -------------------- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | වර්ෂ 02 ක් ඉක්ම වූ රු.9,787,259 ක තැන්පතු | විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු | පිළිගනිමි. පැහැදිලි කිරීම් පසුව ඉදිරිපත් |

| | | | | |
|---|---|---|---|---|
| | 571 | සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | වේ. | කරමි. |
| (ආ) | පලාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය | සභාව සතු කඩ කාමර 248 ක වසර 05 කට වරක් කඩ කුලිය තක්සේරු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. පැහැදිලි කිරීම් පසුව ඉදිරිපත් කරමි. |

2. **<u>මූල්‍ය සමාලෝචනය</u>**

2.1 **<u>මූල්‍ය ප්‍රතිඵල</u>**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.19,574,937 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.53,964,007 ක් විය.

2.2 **<u>මූල්‍ය පාලනය</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------- | --------------- | -------------------------- |
| (අ) | සභා අරමුදල් ප්‍රදේශයේ ජනතාවට උපරිම ප්‍රතිලාභ ලැබිය හැකි පරිදි සැලසුම් සහගතව වැය කිරීම සභාවේ අරමුණ වුවද, සභාව සතු මුදල් රු.මිලියන 22 ක් ස්ථාවර තැන්පතු 06 ක ආයෝජනය කර තිබුණි. | සභාවේ අරමුණුවලට අනුව කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |
| (ආ) | 2014 වර්ෂයේ සිට පැවත එන රු.25,000 ක් වටිනා අගරු වූ චෙක්පතක් නිරවුල් කරගැනීමට කටයුතුකර නොතිබුණි. | අගරු වූ චෙක්පත නිරවුල් කර ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |

2.3 **<u>ආදායම් පරිපාලනය</u>**

2.3.1 **<u>ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්</u>**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | **2018 වර්ෂය** | | | | **2017 වර්ෂය** | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල මුදල | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 26,326,000 | 30,025,147 | 29,610,416 | 27,194,998 | 18,909,000 | 35,427,575 | 30,751,450 | 26,372,753 |
| කුලී | 16,421,000 | 17,390,062 | 18,623,858 | 1,401,952 | 14,916,000 | 17,373,089 | 18,325,021 | 6,392,095 |
| බලපත්‍ර ගාස්තු | 1,723,000 | 1,507,520 | 1,710,478 | - | 1,023,000 | 292,410 | 311,410 | 202,958 |
| වෙනත් ආදායම් | 85,185,000 | 85,045,651 | 104,317,836 | 105,270,206 | 69,196,000 | 69,928,143 | 24,643,077 | 126,813,288 |

2.3.2 **<u>වරිපනම් හා බදු</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------- | -------------------------- |
| (අ) | බිල්කල ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය සියයට 95 ක් වුවද හිඟ ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය සියයට 0 කි. | හිඟ ආදායම රැස්කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.26,904,434 ක් වූ වරිපනම් හිඟ ශේෂය තුල වර්ෂ 1 ට අඩු රු.4,463,971 ක් වර්ෂ 1 ත් 3 ත් අතර රු.6,417,946 ක් වර්ෂ 3ත් 5 ත් අතර රු.3,825,206 ක් සහ වර්ෂ 5 ට වැඩි රු.12,197,310 ක ශේෂයක් තිබුණි. | හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |
| (ඇ) | අවුරුදු 5 ට වැඩි රු.12,197,310 ක් වූ හිඟ ශේෂයෙන් රු.8,434,734 ක් එගොඩපොත උප කාර්යාලයට අයත් විය. මෙම හිඟ ශේෂය තුළ පැවති අවුරුදු 10 ට වැඩි රු.2,632,457 ක ශේෂය ඒකක 852 කින් සමන්විත විය. මෙයින් රු.747,837 ක් වූ ශේෂයේ රු.10,000 ට වැඩි ඒකක 56 ක් විය. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |
| (ඈ) | වේයන්ගොඩ උප කාර්යාලයේ අවුරුදු 10 ට වැඩි රු.114,513 ක් වූ හිඟ ශේෂය තුළ රු.10,000 ට වැඩි ඒකක 03 ක් පැවති අතර සියනෑ කෝරළේ පේෂ කාර්මික ආයතනයෙන් රු.92,379 ක් අයවීමට තිබුණි. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |

2.3.3 **<u>කඩකුලී</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------- | -------------- | ---------------------------- |
| (අ) | වේයන්ගොඩ උප කාර්යාලයට අයත් කඩ 27 කින් අයවිය යුතු වර්ෂ 10 කට වඩා පැරණි රු.4,093,625 ක් වූ පෙර මුදල් ශේෂය අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | පෙර මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. පැහැදිලි කිරීම් පසුව ඉදිරිපත් කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ රු.1,377,419 ක හිඟ ශේෂයක් පැවති අතර මෙම ශේෂය අවු. 1-5 දක්වා කාල පරාසයකට අයත් විය. | හිඟ කඩකුලී අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. පැහැදිලි කිරීම් පසුව ඉදිරිපත් කරමි. |

2.3.4 **වෙනත් ආදායම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ පරිසර බලපත්‍ර ලබා ගතයුතු ව්‍යාපාර 41 සඳහා පරිසර බලපත්‍ර නිකුත් කිරීමකින් තොරව ව්‍යාපාර බලපත්‍ර නිකුත්කර තිබුණි. | පරිසර බලපත්‍ර ලබාදීමකින් තොරව ව්‍යාපාර බලපත්‍ර නිකුත් නොකළ යුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |

2.3.5 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 129 වගන්තියේ සඳහන් උපලේඛනය ප්‍රකාරව රු.99,200,000 ක් වූ මුද්දර ගාස්තු ලබා ගැනීමේදී පනත අනුව වර්ගීකරණයක් සහිතව ලබාගෙන නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. පැහැදිලි කිරීම් පසුව ඉදිරිපත් කරමි. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්ය සාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිලිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් 08 ක් වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ඉටුකළ යුතු කර්තව්‍යයන් වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වේ. | ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ දී අතුරු ව්‍යවස්ථා සම්බන්ධයෙන් මූලිකත්වය ලබා දී සකස් කර ක්‍රියාත්මක කර ඇත. |

(ආ) **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (i) | සභාව විසින් කසළ බදු පැනවීමක් සිදුකර නොතිබුණ අතර සමස්ත බල ප්‍රදේශයෙන් සියයට 40 ක් ආවරණය වන පරිදි පමණක් කසළ එකතුකර බැහැර කිරීමේ සේවාව පවත්වාගෙන ගොස් තිබුණි. | උපරිම සේවාවන් ලබාදීමට කටයුතු කළ යුතු වේ. | පදිංචිකරුවන් විසින් ඔවුන්ගේ ඉඩම් තුළම කසළ කළමණාකරණය කර ගනී. |

| | | | |
|---|---|---|---|
| (ii) | කසළ බැහැර කිරිම සඳහා අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය සමග ගිවිසුම් ගතවීමක් සිදුකර නොතිබුණි. | ගිවිසුම් ගතවීමට කටයුතු කළ යුතු වේ. | ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව මඟින් ලබා දී තිබූ කොන්දේසි අනුව එම ස්ථානය වෙත කසළ බැහැර කිරීමටත් එම කොන්දේසි ලිපියේ පරිදි අදාල ගෙවීම් කිරීමටත් සභාව කටයුතු කර ඇත. |

(ඇ) **පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සභාව වෙත මහජන පැමිණිලි 306 ක් ලැබී තිබූ අතර එයින් මහජන පැමිණිලි 54 ක් පමණ විසඳා නොතිබුණි. | මහජන පැමිණිලි විසඳීමට කටයුතු කළ යුතු වේ. | පිළිතුර හා පැහැදිලි කිරීම පසුව ලබා දෙමි. |

(ඇ) **තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය අනුව ගෝලීය දර්ශක තුලින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය හා සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 වර්ෂයේදී සිදුකර නොතිබුණි. | සැලසුම් අනුව කටයුතු කළ යුතු වේ. | විධිමත් පුහුණුවක් මහ පෙන්වීමක් යටතේ 2019 වර්ෂයේ සිට 2022 සඳහා දීර්ඝ කාලීන සැලැස්මක් සකස් කර ඇති අතර ඒ සඳහා අපගේ විෂය පථයට අදාල වන්නා වූ කරුණු ඇතුලත් වේ. එසේම තිරසර සංවර්ධන අභිමතාර්ථ 17ක් අතුරින් බොහෝමයක් කරුණු අප විසින් මේ වන විටත් ක්‍රියාවට නංවා ඇත. |

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පොදු තැන්පත් ලේඛනයේ පෙර වර්ෂවලට අදාල ශේෂය සහිතව පොදු තැන්පත් ලේඛනය තුලනය නොකිරීම හේතුවෙන් රු.35,129,203 ක් වූ තැන්පත් ගිණුමේ සමුච්චිත ශේෂයේ නිරවද්‍යතාවය විගණනයට තහවුරු කරගත නොහැකි විය. | විධිමත්ව ලේඛන පවත්වාගෙන යා යුතු වේ. | තැන්පත් ලේඛන පවත්වාගෙන යාමේ දෝෂයක් හේතුවෙන් මෙම වරද සිදු වී ඇත. |

3.3 **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආදායම් පරීක්ෂක තනතුරු 04 ක් 2010 වර්ෂයේ සිට 2015 දක්වා වූ කාල පරාසයක සිට පුරප්පාඩු වී තිබූ අතර බඳවා ගැනීමට කටයුතුකර නොතිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. | පුරප්පාඩු වූ ආදායම් පරීක්ෂක තනතුරු 4 ක් සඳහා බඳවා ගැනීම නඩු කටයුත්තක් හේතුවෙන් ප්‍රමාද වී ඇත. |

3.4 **සේවක ණය**

| | | |
|---|---|---|
| සේවය හැරගිය සේවකයෙකුගෙන් අයවිය යුතු රු.117,850 ක මුදල අයවීම අවිනිශ්චිත තත්ත්වයක් විය. | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | අය නොවී පවතින සේවක ණය රු.305,507 ක මුදල අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව කාරුණිකව දන්වමි. |

3.5 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ගලි රථයේ සේවය ලබා දීම සඳහා ලබාගත් රු.96,721 ක් වූ තැන්පතු 2018 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබූ අතර මෙම ශේෂ 2014 සිට 2017 දෙසැම්බර් 31 දක්වා කාල පරාසයකට අයත් විය. | ආදායමට ගතයුතු තැන්පත් ආදායමට ගැනීමට කටයුතු කළ යුතු වේ. | පසුගිය වර්ෂවලට අදාලව මෙතෙක් ආදායමට ගෙන නැති තැන්පත් කඩිනමින් ආදායමට ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | කාය වර්ධන මධ්‍යස්ථානයේ රු.489,000 ක් පිරිවැය වූ උපකරණ 03 ක් ක්‍රියා විරහිත වී තිබුණද අළුත්වැඩියා කිරීමට කටයුතුකර නොතිබුණි. | සුදුසු පරිදි අළුත්වැඩියාවන් සිදුකළයුතු වේ. | ක්‍රියා විරහිත වී තිබූ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම සඳහා අදාළ මිලදී ගත් ආයතන වෙතින් මිල ගණන් විමසා ඇත. |
| (ඇ) | ප්‍රාදේශීය සභාව සතුව කඩ කාමර 356 න් 46 කට පමණක් 2018 දෙසැම්බර් 31 දිනය වන විට කුලී ගිවිසුම් අත්සන්කර තිබුණි. කඩ කාමර 253 ක් 2018 දෙසැම්බර් 10 දිනටත් මාසික කඩ කුලිය රු.300 ක් වැනි අඩු කුලියක් මත දී තිබූ අතර මෙම කුලිය 1980 – 1989 වර්ෂ වලදී තීරණය කරන ලද්දක් විය. | කඩ කුලියට ලබාදීමේදී ගිවිසුම් අත්සන් කිරීමටත් නව තක්සේරු ලබා ගැනීමටත් කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |
| (ඈ) | වේයන්ගොඩ පොදු වෙළඳ සංකීර්ණයේ ඉදිකර ඇති කඩ කාමර 69 ක් සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | | |

| | | | |
|---|---|---|---|
| (i) | මෙම කුලියට දෙන ලද කඩවල අවම කඩ කුලිය රු.500 ක් වූ අතර උපරිම කුලිය රු.2,175 ක් පමණ විය. | නව තක්සේරු ලබාගත යුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |
| (ii) | අඩු කුලියට ලබාදී තිබූ ඉදිරිපෙල කඩ වලින් කඩ 05 ක් පමණ රු.10,000 සිට රු.25,000 දක්වා වූ මාසික කුලියකට බදු කරුවන් විසින් උප බදු දී තිබුණි. | ගිවිසුමට අනුකූලව කටයුතු කළයුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |
| (iii) | 2018 දෙසැම්බර් 10 දින වන විට කඩ 69 න් 17 ක් වසා දමා තිබූ අතර කඩ කාමර 05 නැවත පවරා ගැනීමට කටයුතු කර තිබුණි. | කඩ කාමර වසා දැමීමට හේතු සොයා බැලිය යුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |

3.5 **<u>වාර්ෂික භාණ්ඩ/ තොග සමීක්ෂණය</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට සිදුකරන ලද පුස්තකාල පොත් සමීක්ෂණය අනුව රු.99,335 ක් වටිනා පොත් 541 ක් හා, වටිනාකම සඳහන් නොකළ පොත් 316 ක් අස්ථාන ගතවීම පිළිබඳව සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අස්ථානගත පොත් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. | විමසුම පිළිගනිමි. සමාලෝචිත වර්ෂය භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් හදුනාගත් අස්ථානගත පොත් සම්බන්ධයෙන් අදාළ පුස්තකාලයාධිපතිවරුන් දැනුවත් කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනිමට උපදෙස් ලබා දී ඇති බව දන්වමි. |

3.5.1 **<u>හඳුනාගත් පාඩු</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ජල බිල්පත් ගෙවීම ප්‍රමාදය හේතුවෙන් ජල සැපයුම විසන්ධි කිරීමේ අවස්ථා 05 කදී නැවත සම්බන්ධ කිරීමේ ගාස්තු හා දඩ මුදල් වෙනුවෙන් රු.17,250 ක් ගෙවීම්කර තිබුණි. | වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ජල බිල්පත් ගෙවීමට ප්‍රමාද වූ උපකාර්යාල දෙකෙහි අධිභාර මුදල් ගෙවන ලෙස දැනුවත් කර ඇත. |
| (ආ) | සභාවට අයත් 305 A වර්ගයේ මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයේ ධාවන වාර්තාවලට අනුව 2016 ජුනි 29 දින සිට ධාවනයට යොදාගෙන නොතිබුණි.ධාවනයෙන් ඉවත්කර වර්ෂ 02 කට පසුව 2018 මැයි 03 දින යන්ත්‍රය අළුත්වැඩියාව සඳහා යොමුකර පසුව වෙන්දේසි කර | මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කළයුතු වේ. | පිළිගනිමි. පිළිතුරු සහ පැහැදිලි කිරීම් පසුව දැනුම් දෙමි |

තිබුණි. එම කාලය තුල මෙම යන්ත්‍රයට පූර්ණ රක්ෂණය සඳහා රු.343,086 ක් වැයකර තිබුණි.

3.6 **ප්‍රසම්පාදනය**

3.6.1 **සැපයීම් හා සේවා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී ප්ලාස්ටික් ඇඳිපුටු 1000 ක් මිලදී ගැනීමේදී එම ඇඳිපුටු 1000 ම එක් ආයතනයකින් එකක් රු.1,122 ක බැගින් මිලදී ගැනීමේ හැකියාව තිබියදී පුටු 500 ක් එකක් රු.1,250 බැගින් වෙනත් ආයතනයකින් මිලදී ගැනීම නිසා රු.64,000 ක මූල්‍ය පාඩුවක් සිදුවී තිබුණි. | අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. පිළිතුරු සහ පැහැදිලි කිරීම් පසුව දැනුම් දෙමි |

3.6.2 **නොවිසඳී ඇති විගණන නිරීක්ෂණ හා පිළිතුරු නොදුන් විගණන විමසුම්**
**නොවිසඳී ඇති විගණන නිරීක්ෂණ**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පූර්ව වර්ෂයේ වාර්තාවෙන් නිරීක්ෂණය වූ රු.450,000 ක් වටිනා ජල මෝටර් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 අනුව කටයුතුකර නොතිබුණි. | මුදල් රෙගුලාසි නියමයන්ට අනුව කටයුතු කළ යුතු වේ. | අත්තනගල්ල ප්‍රදේශීය සභාවේ තිබූ බෙලින් යන්ත්‍ර යේ මෝටරය අස්ථාන ගත වීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව මූලික පරීක්ෂණයක් සිදු කර වගකිව යුත්තන් නිර්ණය කර ගැනීම සඳහා සහකාර කොමසාරිස් කාර්යාලයට භාර දී ඇත. |